රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 03/2020

මගේ අංකය : Pns/P4/W&OP/CONT-FEE/SUB-I
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2020.12.31

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු දායක මුදල් අයකිරීම පිළිබඳ විස්තර පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම</u>**

1898 අංක 01 දරන වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ආඥා පනත හා 1983 අංක 24 දරන වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් පනත අනුව සෑම රාජ්‍ය නිලධාරියෙකුම වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක වීම අනිවාර්ය වේ. ඒ අනුව සෑම ආයතන ප්‍රධානියෙකුම තමා යටතේ වන නිලධාරීන්ගේ වැන්දඹු අනත්දරු දායක මුදල් අයවන බව තහවුරු කර ගත යුතුය. වර්තමානයේ දී විශ්‍රාමික නිලධරයන්ට විශ්‍රාම වැටුප සහ දායක මුදල් ආපසු ගෙවීම් නියමිත කාලය තුළ ගෙවීමට නොහැකි වීමට ඔවුන්ගේ සේවා කාලය තුළ වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු දායක මුදල් අයවූ බවට වන තොරතුරු පෞද්ගලික ලිපි ගොනුවෙහි ඇතුළත්ව නොතිබීම ප්‍රධාන හේතුවක් ලෙස හඳුනාගෙන ඇත.

02. පෙර වර්ෂයන් සඳහා වැන්දඹු අනත්දරු දායක වීම පිළිබඳ විස්තර සම්පූර්ණ කිරීමට වසර දෙකක සහන කාලයක් ලබාදෙනු ලැබේ.

03. වසර දෙකක සහන කාලය තුළ විශ්‍රාම යන නිලධාරීන්ට පමණක් අවම වශයෙන් වසර 10 ක කාලයක් තුළ වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට අඛණ්ඩව දායක වී ඇති බව තහවුරු වන්නේ නම් හා අඛණ්ඩව දායක වී ඇති බව නිරීක්ෂණය වන්නේ නම් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට එම තොරතුරු යොමු කිරීම ප්‍රමාණවත් වේ.

04. ප්‍රමාදයකින් තොරව විශ්‍රාම යන නිලධරයන්ගේ ප්‍රතිලාභ කඩිනමින් ලබාදීම තහවුරු කිරීම පිණිස වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු දායක මුදල් අයකිරීම සම්බන්ධයෙන් හා වාර්තා කිරීම සම්බන්ධයෙන් පහත ක්‍රියාමාර්ග ගැනීමට අදාළ බලධාරීන් කටයුතු කළ යුතු ය.

(අ) නිලධාරියා විශ්‍රාම ගැන්වීමට ප්‍රථම ඔහුගේ/ ඇයගේ පෞද්ගලික ලිපි ගොනුව පරීක්ෂා කර ලිපි ගොනුවේ අඩුපාඩු සම්පූර්ණ කිරීම හා රජයට අයවීම් සම්බන්ධයෙන් තහවුරු කර ගැනීම.

(ආ) වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයේ සාමාජිකත්වය ලබාගෙන ඇති දැනට සේවයේ නියුතු සෑම නිලධාරියෙකුගේ ම මුල් පත්වීම් දින සිට ඔවුන් සේවය කළ ආයතන වලින් ඔහුට/ ඇයට අදාළව වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු දායක මුදල් නිසි පරිදි අයකර ඇති බවට තොරතුරු ලබා ගෙන පෞද්ගලික ලිපි ගොනුවට ඇතුළත් කිරීම.

(ඇ) නිලධාරියෙකු/ නිලධාරිනියකගේ සෑම ස්ථාන මාරුවීමක දී ම තම ආයතනය තුළ ඔහුගේ/ ඇයගේ වැටුපෙන් වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු දායක මුදල් අයකිරීම් සම්බන්ධ වාර්තා ඇමුණුම 02 හි දක්වා ඇති ආකෘතියට අනුව සම්පූර්ණ කර පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කර, නව සේවා ස්ථානය වෙත පෞද්ගලික ලිපි ගොනුව මාරු කිරීමට කටයුතු කිරීම.

(ඈ) ද්විතීයන පදනම මත වන මුදාහැරීම්වල දී විශ්‍රාම වැටුප් හිමිකම ආරක්ෂා කර ගැනීම සඳහා ගෙවිය යුතු 25% හා වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු දායක මුදල් 6% හෝ 7% අයකිරීම් සම්බන්ධ වාර්තා පෞද්ගලික ලිපි ගොනුවට ඇතුළත් කිරීම.

05. වර්තමාන සේවා ස්ථානයට පැමිණීමට පෙර සේවය කළ සේවා ස්ථානයන් මඟින් අයකරන ලද වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් පිළිබඳ විස්තර ඇතුළත් කරන ආකාරය සම්බන්ධව උදාහරණයක් මේ සමඟ ඇති ඇමුණුම 01 මඟින් දක්වා ඇති උපදෙස් මාලාවේ අංක 04 යටතේ දක්වා ඇත.

06. ඉහත සඳහන් උපදෙස් පරිදි කටයුතු නොකිරීම හේතුවෙන් කිසියම් නිලධරයෙකුගේ විශ්‍රාම වැටුප නියමිත දිනට ගෙවීමට නොහැකි වුවහොත් එම ප්‍රමාදය සම්බන්ධයෙන් අදාළ ආයතන ප්‍රධානියා වගකීමෙන් බැඳෙන බව ද වැඩිදුරටත් අවධාරණය කරමි.

ජේ.ජේ.රත්නසිරි
ලේකම්
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය

ඇමුණුම 1

**වැන්දඹු/ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් අය කිරීම පිළිබඳ ආකෘතිය (ඇමුණුම 2) සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්:**

1. ආකෘති පත්‍රයේ අංක 03 හි සඳහන් කාල සීමාව ලෙස ඔබ ආයතනයේ වැටුප් ගෙවීම ආරම්භ කරනු ලැබූ දින සිට නිලධරයා ස්ථාන මාරු වී යන දිනය (එනම් ඔබ ආයතනයේ වැටුප් ගෙවීම අවසන් වන දිනය) දක්වා කාල සීමාව අදාළ වේ.

2. එසේම යම්කිසි නිලධාරියෙකු වසර 05ක් ඉක්මවා එම කාර්යාලයේම සේවය කරන්නේ නම් එම වසර 5 ඉක්මවන වසරේ දෙසැම්බර් 31 දිනට ඊළඟ වාර්තාව සම්පූර්ණ කළ යුතුය.

   2.1. යම්කිසි නිලධාරියෙකු වසර 5 කට අඩු කාලයකදී වෙනත් කාර්යාලයකට ස්ථාන මාරු ලබන විට ඔහු/ ඇය එම ආයතනය තුළ සේවය කළ අවසන් මාසය දක්වා වාර්තාවක් සැකසිය යුතුය.

3. කිසියම් නිලධරයකුට ඔබ ආයතනය මඟින් වැටුප් ගෙවීම ආරම්භ කරනු ලැබූ දින සිට වක්‍රලේඛය නිකුත් කළ දින දක්වා කාලය වසර 5 ඉක්මවන්නේ නම් එම මුළු කාලය සඳහාම එක් වාර්තාවක් සැකසිය යුතුය.

4. ආකෘති පත්‍රයේ අංක 04 වගන්තියේ වගුවේ කාල සීමාවන් වෙන් කිරීම පිළිබඳ උදාහරණයක් පහත දැක්වේ.

**කාර්යාල කාර්ය සේවය - III පන්තියේ සේවය කළ අයෙකුගේ වැන්දඹු අනත්දරු දායක මුදල් ගණනය කළ යුතු ආකාරය පහත සඳහන් වේ.**

- වැටුප් වර්ධක දිනය මැයි 1 වනදා වේ.

| අනු අංකය | කාල සීමාව | | වැටුප් ගෙවීමේ ස්වභාවය | වාර්ෂික ඒකාබද්ධ වැටුප | අයකළ වැන්දඹු/ වැන්දඹු පුරුෂ අනත්දරු දායක මුදල් | ද්විතීයන පදනම මත සේවය කරන ලද කාල සඳහා (25%) |
|---|---|---|---|---|---|---|
| | සිට | දක්වා | | රු. | රු. | රු. |
| I. | 2000.05.01<br>2001.05.01<br>2002.05.01 | 2001.04.30<br>2002.04.30<br>2002.07.23 | වැටුප් සහිත | 40,800.00<br>41,760.00<br>42,720.00 | 2448.00<br>2505.60<br>590.96 | |
| II. | 2002.07.24 | 2002.12.31 | අඩ වැටුප් | 21,360.00 | 1124.96 | |
| III. | 2003.01.01 | 2003.03.31 | වැටුප් රහිත | - | 640.80 | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| IV. | 2003.04.01<br>2003.05.01 | 2003.04.30<br>2003.06.30 | වැටුප් සහිත | 42,720.00<br>43,650.00 | 213.60<br>436.50 | |
| V. | 2003.07.01<br>2004.01.01<br>2004.05.01 | 2004.03.31<br>2004.04.30<br>2004.06.30 | ද්විතීයන පදනම මත මුදා හැරීම | 43,650.00<br>58,680.00<br>59,640.00 | 1309.50<br>1173.60<br>596.40 | |
| VI. | 2001.01.01 | 2003.06.30 | වැඩිපුර ගෙවූ වැටුප් | 10,000.00 | (600.00) | |
| VII. | 2004.07.01 | 2004.12.31 | වැටුප් සහිත | 59,640.00 | 1789.20 | |
| VIII. | අයකර ඇති වැන්දඹු අනත්දරු මුළු මුදල | | | | 12,229.12 | |
| IX. | පැරණි සේවා ස්ථාන වලට අදාළ අය කිරීම් | | | | XXXX | |
| X. | අද වන තෙක් අය කර ඇති මුළු වැන්දඹු අනත්දරු දායක මුදල | | | | VIII + IX | |

සැ.යු. - විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 3/2008 හා 2/2013 අනුව සකස් කර ඇත.

වැටුප් රහිත හා අඩ වැටුප් සඳහා ද වැන්දඹු අනත්දරු දායක මුදල් ලෙස 6% අඩු කර ඇත.

**ඇමුණුම 2**

මගේ අංකය:............
දිනය:...........

.........................
(ආයතන ප්‍රධානී)

## <u>වැන්දඹු /වැන්දඹු පුරුෂ හා අනත්දරු දායක මුදල් අයකිරීම පිළිබඳ විස්තරය</u>

පහත නම් සඳහන් අයගේ පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා මෙම වාර්තාව ඉදිරිපත් කරමි.

1. නිලධරයාගේ නම :-
2. තනතුර :-
3. වැටුප් ගෙවන ලද කාලසීමාව :-
4. දායක මුදල් අයකළ කාලසීමාව:-
5. හිඟ දායක මුදලක් ඇත්නම් ඒ පිළිබඳ විස්තර :-
6. අයකරන ලද වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් පිළිබඳ විස්තරය

| අනු අංකය | කාල සීමාව | | වැටුප් ගෙවීමේ ස්වභාවය | වාර්ෂික ඒකාබද්ධ වැටුප | අය කළ වැන්දඹු/ වැන්දඹු පුරුෂ අනත්දරු දායක මුදල් | ද්විතීයන පදනම මත සේවය කරන ලද කාල සඳහා (25%) |
|---|---|---|---|---|---|---|
| (I) | සිට | දක්වා | | රු. | රු. | |
| (II) | | | | | | |
| (III) | | | | | | |
| (IV) | | | | | | |
| (V) | | | | | | |
| (VI) | | | | | | |
| (VII) | | | | | | |
| (VIII) | | | | | | |

7. ඉහත සඳහන් විස්තර නිවැරදි බවත් පවතින විධිවිධාන අනුව වැන්දඹු/ වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් නිවැරදිව අයකර අදාළ ආදායම් ශීර්ෂයට බැර කර ඇති බවත් මෙයින් තහවුරු කරමි.

.......................................
(ගණකාධිකාරී)
(නිල මුද්‍රාව)

8. ඉහත දක්වා ඇති පරිදි නිලධරයාගේ වැන්දඹු/ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් නිසි පරිදි අයකර ඇති බව සහතික කරමි.

..........................................
(දෙපාර්තමේන්තු ප්‍රධානී)
(නිල මුද්‍රාව)

පිටපත:- නිලධාරියා